සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - චිත්‍ර කලාව

අගෝස්තු 02 සතිය

ශ්‍රේණිය - 10 (III වාරය)

සැකසුම - රූපිකා ජයන්ති (සිරිසමන් ජා. පා.)
දැරණියගල කොට්ඨාසය

## සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

පාඩම/ඒකකය - 1.2.2 රන් දැතයි සරු පොළවයි

### "රන් දැතයි සරු පොළවයි" සිතුවමට නගමු. මෙය මහනුවර චිත්‍ර සම්ප්‍රදායයෙන් අඳින්න.

1. ඉගෙනුම් ආධාරක

- මහනුවර යුගයට අයත් චිත්‍ර
- මහනුවර යුගයෙහි ලක්ෂණ දැක්වෙන චිත්‍ර







## 2. ක්‍රියාකාරකමෙහි නිරත වීමට උපදෙස්

- මහනුවර යුගයේ චිත්‍රවල දක්නට ලැබෙන පොදු ලක්ෂණ
  - අඛණ්ඩ කථන ක්‍රමයට ඇඳීම - කතාව දිගින් දිගටම ඇඳීම. මෙහි දී අදහස් ප්‍රකාශනයට මුල් තැනක් ලබා දී ඇත.
  - නරඹන්නන්ට පහසුවෙන් තේරුම් යන සේ ඇඳිය යුතු ය.
  - මානව, සත්ව රූප, ශාක ශෛලිගත ව නිර්මාණාත්මක ව ඇඳිය යුතු ය.
  - ද්විමාන ලෙස වර්ණ භාවිතය - පසුතලයට තනි වර්ණයක් භාවිත කළ යුතු ය
  - රූප වටේ රේඛාවක් දැක්වීම කළ හැකි ය
  - පසුබිම සම්මත සැරසිලි මල්වලින් දක්වා තිබීම
  - සාම්ප්‍රදායික සැරසිලි මෝස්තර අධ්‍යයනය කරන්න
  - ඉහත සඳහන් කර ඇති පොදු ලක්ෂණ මෙහි දැක්වෙන චිත්‍රවල දක්නට ලැබෙන්නේ දැ යි හොඳින් අවධාරණය කරගන්න

## 3. ඇගයීම

1. රන් දෑතයි සරු පොළවයි යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න.

2. මෙයින් ගොවි ගෙවිලියන්ගේ දෑතින් සරුවන මහපොළොව අලංකාර ලෙස සිතුවමට නැගිය යුතු ය.

3. දැන් ඔබ මහනුවර යුගයේ චිත්‍රවල දක්නට ලැබෙන පොදු ලක්ෂණ අනුව ඉහත මාතෘකාවට දළ සටහනක් අඳින්න.

4. මෙහි දී ගොවි ගෙවිලියෝ ක්‍රියාකාරී ලෙස සරු බිමෙහි පැළ සිටුවීම, අස්වනු නෙලීම, ගොයම් පෑගීම වැනි මිනිස් හා සත්ව ක්‍රියාකාරකම් චිත්‍රයට එක්කරගත හැකි ය.

5. ඔබ අඳින ලද දළ සටහන දැන් ඔබේ චිත්‍ර පොතේ අඳින්න. වර්ණ ගැන්වීමේ දී මහනුවර යුගයේ සාම්ප්‍රදායික ක්‍රම අනුගමනය කරන්න.

6. ඇඳුම් පැළඳුම් සඳහා සුදුසු මෝස්තර යොදා අලංකාර කරන්න.

7. පැය දෙකක කාලයක දී නිම කරන්න.